**සීමාසහිත කොලදෙනිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම - 2017**

**--------------------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත කොලදෙනිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**-------**

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 69,585,957 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 54,757,419 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. 14,828,538 ක වර්ධනයක් දක්නට ලැබුණි. බලශක්තිය උත්පාදන ආදායම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාතයන්**

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ සමාගමේ ඇතැම් වැදගත් ගිණුම්කරණ අනුපාතයන් කිහිපයක් පහත දැක්වේ.

| | **2017** | **2016** |
|---|---|---|
| දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 60 | 55 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1:16 | 1:54 |

පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී දළ ලාභ අනුපාතය සියයට 9 කින් වැඩිවී තිබුණු අතර ආදායම රු.මිලියන 12 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවණතාවය විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන් සමඟ සසඳා විචලනයන් පහත දැක්වේ.

| අයිතමය | 2017 | 2016 | විචලනය | |
|---|---|---|---|---|
| | | | සතුටුදායක/ (අහිතකර) | ප්‍රතිශතයක් ලෙස |
| | රු. | රු. | රු. | % |
| විදුලි බලාගාර කුලියට දීමෙන් ආදායම | 88,427,927 | 75,767,005 | 12,660,922 | 17 |
| විකුණුම් පිරිවැය | 35,027,564 | 33,921,202 | (1,106,362) | 3 |
| පරිපාලන වියදම් | 9,228,418 | 3,893,565 | (5,334,853) | 137 |
| ස්ථාවර තැන්පතු පොළී ආදායම | 24,717,492 | 12,681,516 | 12,035,976 | 95 |

සමාලෝචිත වර්ෂයේදී විදුලි බලාගාර කුලියට දීමේ ආදායම් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය ආසන්න වශයෙන් රු.මිලියන 24.69 කින් ඉහළ ගොස් තිබුණද, CSR ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලැබූ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් හේතුවෙන් පරිපාලන වියදම්වල ඇතුළත්ව තිබූ අනෙකුත් වියදම් ආසන්න වශයෙන් රු.මිලියන 5 කින් ඉහළ ගොස් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාගමේ ප්‍රධාන අරමුණ වනුයේ කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම, මෙහෙයවීම හා කළමනාකරණය මගින් ජාතික විදුලිබල පද්ධතියට විදුලිය නිෂ්පාදනය සහ විකිණීම වේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 03 ක සමාගමේ විදුලි උත්පාදනය හා ආදායම් ඉපැයීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | විදුලි බලය උත්පාදනය | ආදායම |
|---|---|---|
| | කිලෝවොට් | රු.මිලියන |
| 2017 | 5,461,989 | 88.43 |
| 2016 | 4,692.097 | 75.76 |
| 2015 | 6,080.927 | 97.23 |
| 2014 | 5,753.953 | 91.54 |

ශක්‍යතා අධ්‍යයන අදියරයේදී ඇස්තමේන්තුගත වාර්ෂික විදුලි උත්පාදනය නිෂ්පාදන කිලෝවොට් 4,688,086 ක්ව තිබුණත්, ඇස්තමේන්තුගත අගයට සාපේක්ෂව සමාගමේ සත්‍ය විදුලි උත්පාදනය ඉහළ ගොස් තිබුණි.

## 5. තිරසාර සංවර්ධන අරමුණු

2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනතේ නියමකර ඇති පරිදි තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුය. එසේ වුවත් වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සමාගම විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණ, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.